# වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

# ඇබෑර්තු

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**තනතුර** - **කළමනාකරු (පරිපාලන / මානව සම්පත්) - තනතුරු 01**

**සුදුසුකම්** - බාහිර අපේක්ෂකයන්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන මානව සම්පත් / ව්‍යාපාර පරිපාලන / රාජ්‍ය පරිපාලන / ව්‍යාපාර අධ්‍යයන / කළමනාකරණය / වාණිජ / රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ප්‍රථම උපාධියක්

සහ

ප්‍රථම උපාධිය ලබාගැනීමත් පසුව තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පශ්චාත් පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අපේක්ෂකයන් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අපේක්ෂකයන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම
2. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක් තුළ කනිෂ්ඨ කළමනාකරු (JM) කාණ්ඩයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවාවක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය** - කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 පරිදි MM 1-1-2016 රු. (53,175-10x1,375-15x1,910-95,575) යන වැටුප් පරිමාණය ඉහත තනතුරට හිමිවේ.

**වයස** - අවුරුදු 22 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 45 ට වැඩි නොවිය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයන් සඳහා අදාළ නොවේ.

**අතිරේක ප්‍රතිලාභ** - බාහිර හා අභ්‍යන්තර වෛද්‍ය රක්ෂණාවරණ හිමිකම, සේවක අර්ථ සාධක අරමුදලට හෝ ලංකා වැවිලි කරුවන්ගේ අර්ථ සාධක සමිතියට සේවක වැටුපෙන් 10% ක අවම දායකත්වයක් හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙතින් අර්ථ සාධක අරමුදලට 12% ක හා සේවක භාරකාර අරමුදලට 3% ක දායකත්වය.

**බඳවා ගැනීමේ පරිපාටිය** - පත්වීම් ලබා දීමේ බලධාරියා විසින් පත් කරන ලද පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අයදුම්කරුවන් තෝරාගනු ලැබේ.

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය** -

| | | | |
|---|---|---|---|
| අදාළ අතිරේක පළපුරුද්ද | - | ලකුණු | 30 |
| අදාළ අතිරේක සුදුසුකම් | - | ලකුණු | 30 |
| අනෙකුත් සාධන (ජයග්‍රහණ) | - | ලකුණු | 15 |
| සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් කාර්ය සාධනය | - | ලකුණු | 25 |
| | | ලකුණු | 100 |

**අනෙකුත්** - මෙම කාණ්ඩය සඳහා වන සියලුම බඳවාගැනීම් බඳවාගැනීමේ පටිපාටියේ විධිවිධාන දැඩි ලෙස අනුගමනය කරනු ලැබේ.

සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

මෙම තනතුරේ කාර්යයන් මනා ලෙස ඉටු කිරීම සඳහා සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත මනා සෞඛ්‍ය තත්ත්වයකින් පරිපූර්ණ විය යුතුය.

සියලුම අයදුම්කරුවන් මනා චරිතයකින් හෙබි පුද්ගලයින් විය යුතුය.

**අයදුම්පත්** - අයදුම්කරුවන් සියලු විස්තර ඇතුළත් ස්වකීය අයදුම්පත් උප්පැන්න, අධ්‍යාපන හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමග, අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කර පහත සඳහන් ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපැල් මගින් යොමු කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

**අයදුම්පත් භාරගන්නා වූ අවසාන දිනය** - අයදුම්පත්, 2023 ඔක්තෝබර් 27 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට යොමු කළ යුතුය.

**සභාපති,**
**ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව,**
**අංක 257, සිරිධම්ම මාවත, කොළඹ 10.**

**2023.10.09**